අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! ජනයා අතර වඩාත් ශ්රේෂ්ඨ වනුයේ කවරෙක් ද?

අබූ සඊද් අල් කුද්රී (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. මිනිසෙක්: ‘අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! ජනයා අතර වඩාත් ශ්රේෂ්ඨ වනුයේ කවරෙක් ද?’ යැයි විමසීය. එතුමාණෝ: “අල්ලාහ්ගේ මාර්ගයේ තමන් හා තම ධනය කැප කරන දේව විශ්වාසී තැනැත්තා” යැයි පැවසූහ. පසුව කවුරුන්දැ?යි විමසීය. එතුමාණෝ:
“කදු කපොල්ලක හුදකලාවේ තම පරමාධිපතිට නැමදුම් කරමින් තමන්ගෙන් සිදුවන හානියෙන් ජනතාව වළක්වාලන අයකු වේ.” යැයි පැවසූහ. තවත් වාර්තාවක සඳහන් පරිදි: “අල්ලාහ්ට
බැතිමත්ව තමන්ගෙන් සිදුවන හානියෙන් ජනතාව වළක්වාලන අයකු වේ යැයි” සඳහන්ව ඇත.
[පූර්ව සාධක සහිත හදීසයකි.] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත. එම පද පෙළ ඉමාම් මුස්ලිම්ට අයත්ය.]

මිනිසුන් අතරින් වඩාත් ශ්රේෂ්ඨයා කවුරුන්දැ?යි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාගෙන් විමසන ලදී. එවිට එතුමා අල්ලාහ්ගේ මාර්ගයේ තම ධනය හා තම ජීවිතය කැපකරමින් කටයුතු කරන මිනිසා යැයි පැහැදිලි කර සිටියේය. පසුව කවරෙකු දැ?යි විමසන ලදී. එතුමා අල්ලාහ්ට නැමදුම් කරන ජනයාගෙන් හානිය වළක්වාලන පුද්ගලයා යැයි පැවසූහ. එනම් ඔහුගෙන් කිසිදු හානියක් ජනයාට අත්වීම ඔහු ප්රිය කරන්නේ නැත.

https://sunnah.global/hadeeth/si/show/5773